ජාතික ළමා සංවර්ධන අරමුදල - 2017
------------------------------------

ජාතික ළමා සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** විගණකගේ වගකීම
-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ . තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **2017** දෙසැම්බර් **31** දිනට ජාතික ළමා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **02** ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

අමාත්‍ය මණ්ඩල තීරණයක් මත අරමුදලේ කටයුතු අවසන් කිරීමට **2017** දෙසැම්බර් **19** දිනැති අංක PFD/SOP/WMCA/001/FD/03 දරන ලිපියෙන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් නියෝග කර තිබුණ ද, ඒ පිළිබඳව ගිණුම්වල හෙලිදරව් කිරීමක් කර නොතිබුණු අතර, රු.**5,000,000** ක් වටිනා ස්ථාවර තැන්පත් ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2017** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.**869,916** ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.**1,996,766** ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **1,126,850** ක පිරිහීමක් සිදු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ළමා සංවර්ධන අරමුදල පිහිටුවීමේ අරමුණ වූයේ යුද වාතාවරණය හා වෙනත් ස්වභාවික ආපදාවන් නිසා තම දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වූ දරුවන්ට මෙන්ම ආර්ථික දුෂ්කරතා නිසා තමන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට හා සහජ කුසලතා හා වෙනත් දක්ෂතා වර්ධනය කර ගැනීමට නොහැකි වූ ශ්‍රී ලාංකික දරුවන්ට මූල්‍යමය ආධාර ලබා දීම වේ.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 ජනවාරි 24 දිනැති අංක අමප/13/1436/528/008-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කොඩි අලෙවියෙන් ලැබෙන අරමුදල් ද උපයෝගී කර ගනිමින් අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජිත වැඩසටහන් වඩා ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතුය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලෝක ළමා දිනය වෙනුවෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් කොඩි 400,000 ක් මුද්‍රණය කර, එක් කොඩියක් රු.10 බැගින් අලෙවි කිරීම සඳහා පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුලදී කොඩි අලෙවියෙන් ලද රු.332,416 ක හා ස්ථාවර තැන්පත් ආයෝජන මගින් ලද රු. 869,916 ක් වූ ආදායම ද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු. 5,618,262 ක මුදල ළමුන්ට ආධාර ගෙවීම සඳහා යොදා ගෙන නොතිබුණ අතර, 2015 හා 2016 වර්ෂවල ද කිසිදු ආධාර මුදලක් අදාල පාර්ශවයන්ට ගෙවීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ආ) ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අරමුදල පාලනය කිරීම, අන්තර් අමාත්‍යාංශ අධීක්ෂණ කමිටුවක් මගින් සිදුකල යුතු අතර, අවම වශයෙන් මාසයකට වරක් එම කමිටුව රැස්විය යුතු වුවද, 2015 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා එම කමිටුව එක් වරක්වත් රැස් වී නොතිබුණි.